ආනන්ද පද්මසිරි

පෘතුගීසීන් ශ්‍රී ලංකාව ආක්‍රමණය කළේ ක්‍රි.ව. 1505 දීය. මෙරට රජවරුන් සමඟ සටන් වදිමින් ඔවුන් මෙහි ගත කළ කාලය තුළදී ශ්‍රී ලාංකිකයන්ට ඔවුන්ගෙන් යම් යම් දේ උරුම වූ අතර ඒවා අපේ සංස්කෘතිය හා ජන ජීවිතය හා බද්ධ විය.

# බයිලා රජුට උපහාර

***ලංකාවට බයිලා ගෙනා වොලී බැස්ටියන්***
***බයිලාවලින් රට හොල්ලපු බයිලා චැම්පියන්***
***සමාජ සේවකයා***
***ඔහු පොලිසියේ ගායකයා***
***කිව්වම කවිද නොදන්නේ***
***වයලින් වාදකයා***
***ඔහු බයිලා නායකයා***
***කවුරුත් මේ බව දන්නේ***

"බයිලා" නැමැති ගීත සම්ප්‍රදාය එසේ ඔවුන්ගෙන් අපට උරුම වූවකි. එවක් පටන් එය අපේ කලාව සමඟ මුසුවී මේ දක්වා නොනැසී පවතී. පණ්ඩිත් අමරදේවයන් ජීවත්ව සිටියදී නිතර පැවසුවේ බයිලාව නැමැති කලාංගය කිසිවිටක බැහැර කල නොහැකි බවය. බයිලාවට ප්‍රසිද්ධ මෙ-ාරටුවේ කොරලවැල්ල ගමේ උපන් පණ්ඩිත් අමරදේව (ඩබ්ලිව්. ඩී. ඇල්බට් පෙරේරා) මුල් කාලයේ ගමේදී බයිලා ගයා ඇත. එමෙන්ම ඔහු හැදූ "පිපී රේණු නටන" හා " හාරිච්චි බෝරිච්චි" වැනි චිත්‍රපට ගීතවලට මෙන්ම "රන් වන් කරල් " චිත්‍රපටයට ඔහුම ගැයූ "ආලේ බැන්ද මාගේ පනේ සෝමාවතී" ගීතයටද තනු නිර්මාණය කරද්දී අමරදේවයන් බයිලා ශෛලය





උපයෝගී කරගෙන තිබේ. පෘතුගීසි යුගයේ අපේ සංගීතයට එකතු වී තිබූ "බයිලාව" නැමැති කලාංගය "ජනකාන්ත කලාංගයක" තත්වයකට පත්කොට බහුතර රසික ජනතාව අතරට ගෙනයාමේ පුරෝගාමියා ලෙස පිලිගැනෙන්නේ "වොලී බැස්ටියන් " කලාකරුවාය. ගී පද රචනය, සංගීත නිර්මාණය හා ගායනය යන ත්‍රිවිධ අංශයෙන්ම දස්කම් පෑ වොලී 1940 පසුව බයිලාව පෙරට ගෙනා අතර අද පවා බො-හෝ බයිලා ගායකයන් ගයන්නේ ඔහු හැදූ ගීතයි.

1914 ජූනි 09 වැනිදා කොළඹ මෝදර ඉපදී 1985 ජනවාරී 10 වැනිදා මිය ගිය වොලී බැස්ටියන්ගේ මුල් නම ඔගස්ටස් මාටිනස් බැස්ටියන්ය. එම නම ගැන පැහැදීමක් නැති බැවින් පසුව ඔහු "ඔලින්ටන් මර්වින් බැස්ටියන්ස්" යනුවෙන් නම සකසා ගත්තේය. "ඔලින්ටන් " යන නම අනුව " ඔලී" යනුවෙන් කෙටියෙන් බොහෝ අය

ඔහුව ඇමතූ අතර සංගීත ලෝකයට ආ විට එම කෙටි නම "වොලී" ලෙසින් යොදා ගත් නිසා ඉන් පසු ඔහු හැඳින්වුනේ "වොලී බැස්ටියන් " නමිනි. ශ්‍රී ලංකා පොලිසියේ නිළධාරියෙකු ලෙස වොලී සේවය කළේය. එය රථවාහන :ඔර්සෙප්* අංශයේ අති දක්ෂ වයලින් වාදකයෙකු මෙන්ම ගිටාර් හා බැංජෝ වාදකයෙකු වූ වොලී වෙනුවෙන් පසු කාලයක බෙස්මන්ද සිල්වා ගායනා කල ගීතයේ ඒබ ව සඳහන් වන්නේ මෙසේයි.

ලංකාවට බයිලා ගෙනා වොලී බැස්ටියන්
බයිලාවලින් රට හොල්ලපු බයිලා
චැම්පියන්
සමාජ සේවකයා
ඔහු පොලිසියේ ගායකයා
කිව්වම කව්ද නොදන්නේ
වයලින් වාදකයා
ඔහු බයිලා නායකයා
කවුරුත් මේ බව දන්නේ

වාද බයිලා තුලින් "සූරයන්ගෙත් සූරයා" වූ වොලී බැස්ටියන් නොනැසෙන බයිලා ගීත රාශියක් නිර්මාණය කළේය. ඔහු ඉංග්‍රීසියෙන්ද සමහර ගී ගයා ඇත. ඍඑඩල පිලිප්ස් සූරිය යන ලේබල්වල තැටි සඳහා වොලී බයිලා ගී ගැයුවේය. හායි හූයි බබී ආච්චිගේ බයිසිකල් එක, යමන් බණ්ඩෝ වෙසක් බලන්න, රටක් වටිනවා මගේ මව්පියෝ දෙන්නා, ලේ කිරි කරලා, අයිරින් ජෝසපින්, කුස්සි අම්මා සේරා, මුහුදේ යමු මසුන් මරන්න, වීරියෙන් සොයා, නොන්ඩි සිමයියා, බිව්වා නේද වදකහ සුදිය, නෙ-ෝනා මගෙ නර්ස් නෝනා, ගොවියා, මිතුරා කීව, වදකභාරියෝ, පූරුවේ පිනකිනි, කිසි වෙහෙසක් නොබලා, ආලේ ආලේ, සුරංගනාවියේ..... ආදී වශයෙන් එම ගීතාවලිය විහිද යයි. මේ බයිලා ගීත අතරින් එකක් හෝ නෑසුවකු සොයා ගත නොහැකි තරම්ය.

ඉතා ජනප්‍රිය බයිලා ගීතයක් වන "නෝනා මගෙ නර්ස් නෝනා" ගීතය වොලී බැස්ටියන් නිර්මාණය කර ඇත්තේ හෙදියකව සිටි තමාගේම සොයුරිය ෆිලීෂියා ෆ්ලොරන්ස් බැස්ටියන්ස් (ජයසේකර) මුල් කරගෙනය. සූර්යග්‍රහන අවස්ථාවක එකල මෙරට සිදුවූ සිදුවීමක් අලලා "වදකහ සුදිය" බයිලා ගීතය වොලී නිර්මාණය කර ඇත.

ඩිලානි මුතුකුඩ වොලි බැස්ටියන්ගේ මිණ-බිරියකි. ඇය විවාහ වී සිටින්නේ කොම්පඤ්ඤවීදිය පොලිසියේ පොලිස් පරීක්ෂක රණසිංහ සමඟය. එම දෙපලගේ දියණිය චේතනා රණසිංහ ජනප්‍රිය දක්ෂ ගායිකාවකි. දෙරන ඩ්‍රීම් ස්ටාර් තුලින් පෙරට ආ චේතනා තමාගේම ගීත රැසක් ගයා ඇත.

ප්‍රවීන ගායක කීර්ති පැස්කුවල්ගේ පුත් ගායක කසුන් පැස්කුවල් සමඟ චේතනා විවාහ වී සිටී. නෑකම අනුව චේතනා රණසිංහ වොලී බැස්ටියන්ගේ "මී මිනිබිරියයි". ඒ වොලී ඇගේ මවගේ සීයා කෙනෙකු වන බැවිනි. ඇගේ මව ඩිලානිගේ මෑණියන් විනීතා බැස්ටියන්ස්ය. ජනප්‍රිය ගායිකා ජූඩි ද සිල්වා මෙන්ම ඇගේ මව කාන්ති ද සිල්වාත් වොලීගේ කිට්ටු ඥාතීන්ය. චේතනා රණසිංහ ඩ්‍රීම් ස්ටාර් තරඟයෙන් පසුව තමන්ගේම ගීත පටිගත කළ යුගයේ චේතනා වොලී අතර ඇති නෑකම දැනගත් ගීත නිබන්ධකයෙක් මුත්තා වෙනුවෙන් ගයන්නට ඇයට බයිලා රජා වොලී බැස්ටියන් ගීතය ලියා දුන්නේය. මුත්තාගෙන් උරුම වූ ගායන හැකියා-වන්ද සහිතව පෙරට යන ගමනේ සංධිස්ථානයක් සනිටුහන් කරමින් දැං චේතනා රණසිංහ මුත්තාට උපහාර පුදන්නට Wally නමින් ගී ප්‍රසංගයක් ගෙන එයි.

"මුත්තා ගැන අතීත තොරතුරු ඉස්සර ඉඳලම අපේ අම්මා අපට කියනවා. ලංකාවේ සංගීතයේ එක අංගයක කිරුල දරපු කෙනෙක්නේ වොලී බැස්ටියන් කියන්නේ. මී මිනිබිරිය හැටියට මමත් මුත්තා ගැන ආඩම්බර වෙනවා. බයිලා රජා වොලී බැස්ටියන් ගීතය මම ගායනා කලෙත් ඒ නිසයි. කාලයක ඉඳලම මෙහෙම ප්‍රසංගයක් කරන්න බලාපොරොත්තුව හිටියා. දැං තමයි ඒ බලාපොරොත්තුව ඉටුකරගන්න හදන්නේ." චේතනා රණසිංහ කියයි.

සන්නස වෙළඳ දැන්වීම්
Sannasa Advrertising

එස් ජයසිංහ / S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

අසෝක සුබසිංහ / Asoka Subasinghe 0432 391 922
email - sannasanews@gmail.com